[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය

Ministry of Education, Higher Education and Vocational Education - Division of Piriven Education

கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 09 | S | I, II |
|---|---|---|

**මධ්‍යවාර පරීක්ෂණය - 2025**

පැය තුනයි

**03 - ශ්‍රේණිය**

**(09) සෞඛ්‍ය විද්‍යාව - I,II**

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සෞඛ්‍ය විද්‍යාව - I **පත්‍රය**

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.
* අංක 1 සිට 40 ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ x ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. "ආරෝග්‍යා පරමා ලාභා" ගාථාවට අනුව පරම ධනය වන්නේ,
(1) සතුට යි. (2) නිරෝගී බව යි. (3) නිර්වාණය යි. (4) විශ්වාසය යි.

02. නීරෝගී පුද්ගලයකුගේ ලක්ෂණයක් සඳහන් වන පිළිතුර කුමක් ද?
(1) නොසන්සුන් ලෙස සිටීම. (2) ශාරීරික පෙනුම විකෘති වීම.
(3) එදිනෙදා කටයුතු අතපසු වීම. (4) ප්‍රකෘතිමත් ශාරීරික පෙනුමක් තිබීම.

03. කායිකව නිරෝගී වුවත් සෞඛ්‍ය සම්පන්න යැයි කිව **නොහැකි** ලක්ෂණයකි.
(1) දිනපතා පිරිවෙනට පැමිණීම.
(2) සක්‍රීය ලෙස පන්ති කාමරයේ ඉගෙනීමේ කටයුතු වල නිරත නොවීම.
(3) ආගමික කටයුතු වල කැමැත්තෙන් යෙදීම.
(4) ඉවසීම ඇති අතර සමාජශීලී වීම.

04. ලෝක සෞඛ්‍ය සංවිධානය හඳුන්වන කෙටි ඉංග්‍රීසි නාමය වන්නේ,
(1) OHW ය. (2) OWH ය. (3) WHO ය. (4) WOH ය.

05. කායික යහපැවැත්ම මැනිය හැකි ලක්ෂණයක් **නො වන්නේ** මින් කුමක් ද?
(1) ශරීර ස්කන්ධ දර්ශකය. (2) පෝෂණ මට්ටම.
(3) ලෙඩ රෝග වලට ඔරොත්තු නොදීම. (4) ශාරීරික යෝග්‍යතාවය.

06. තද දම් පාටින් දැක්වෙන පෝෂණ මට්ටමට අදාළ නිගමනය වනුයේ,
(1) කෘශ බව යි. (2) ස්ථුල බව යි. (3) අධි බර යි. (4) සාමාන්‍ය බර යි.

07. මානසික යහපැවැත්ම ඇති කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු යහපුරුද්දක් වන්නේ,
(1) කාර්ය බහුල දිවි පැවැත්ම යි. (2) විවේකයේ දී පවා ක්‍රියාශීලී වීමයි.
(3) භාවනා කිරීමයි. (4) කාලය කළමණාකරණය නොකිරීමයි.

08. ආහාරයක අඩංගු පෝෂක අතරින් වර්ධක පෝෂකයක් වන්නේ මින් කුමක් ද?
(1) ප්‍රෝටීන ය. (2) විටමින් ය. (3) ලිපිඩ ය. (4) කාබෝහයිඩ්‍රේට් ය.



www.pirivena.lk

09. ලෙඩ රෝගවලින් ආරක්ෂා වීමට අවශ්‍ය වන ආහාර වන්නේ,
(1) ශක්ති ජනක ආහාර යි.
(2) ගුණාත්මක ආහාර යි.
(3) ආරක්ෂක ආහාර යි.
(4) වර්ධක ආහාර යි.

10. ශක්තිජනක ආහාර අවශ්‍ය වන්නේ මින් කුමන කාර්යයක් සඳහා ද?
(1) ශරීරය වර්ධනයට සහ ගෙවී ගිය කොටස් අලුත් වැඩියා කිරීම සඳහා ය.
(2) එදිනෙදා කාර්ය කරගෙන යාමට අවශ්‍ය ශක්තිය ලබා ගැනීම සඳහා ය.
(3) අභියෝගයන් හමුවේ මනස ශක්තිමත් කර ගැනීම සඳහා ය.
(4) ලෙඩ රෝගවලින් ආරක්ෂා වීම සඳහා ය.

11. ජීව ක්‍රියා පවත්වා ගැනීමට අවශ්‍ය ශක්තිය ලබා දෙන ආහාර කාණ්ඩය වන්නේ කුමක් ද?
(1) දොඩං, නාරං, පේර, ගස්ලබු, තක්කාලි
(2) මස්, මාළු, බිත්තර, කරවල, කඩල
(3) චීස්, යෝගට්, කිරි, කුඩා මාළු, මුරුංගා
(4) බත්, අල, කොස්, දෙල් පාන්

12. මොළය, හෘදය, ස්නායු හා අස්ථිවල මනා ක්‍රියාකාරිත්වයට අවශ්‍ය විටමින් B ඇති ආහාර කාණ්ඩය වන්නේ,
(1) ගෝවා, නිවිති, තක්කාලි, තද කොළ පැහැති එළවළු, මස්, මාළු, බිත්තර
(2) කැරට්, බතල, තද කොළ පැහැති එළවළු සහ පලා වර්ග, සලාද, සමහර පළතුරු, මාළු, සත්ව අක්මා
(3) නිවුඩු සහිත සහල්, ධාන්‍ය වර්ග, කිරි, බිත්තර, මස්, මාළු, සොයා, කොළ පැහැති එළවළු
(4) චීස්, බටර්, යොදය සහිත කිරි, බිත්තර, මාළු, සත්ව අක්මා, ධාන්‍ය වර්ග

13. ජලයේ වැදගත්කමක් **නො වන්නේ** මින් කුමක් ද?
(1) ආහාර ජීරණ ක්‍රියාවලිය නිසි ලෙස පවත්වා ගැනීම.
(2) ශරීර උෂ්ණත්ව යාමනය නිසි ලෙස පවත්වා ගැනීම.
(3) ආශ්වාස ප්‍රාශ්වාස ක්‍රියාවලිය නිසි ලෙස පවත්වා ගැනීම.
(4) බහිස්ස්‍රාවී ක්‍රියාවලිය නිසි ලෙස පවත්වා ගැනීම.

14. රුධිරයේ වැදගත්කමක් **නොවන** ප්‍රකාශය කුමක් ද?
(1) ශරීරයේ සියලු ම ඉන්ද්‍රියන් හා සෛල වෙත ග්ලූකෝස් හා ඔක්සිජන් සපයන්නේ රුධිරය යි.
(2) හෝමෝන, ඖෂධ, බහිස්ස්‍රාවීය ද්‍රව්‍ය පරිවහන මාධ්‍යය ලෙස රුධිරය ක්‍රියා කරයි.
(3) සෛලවල ක්‍රියාකාරිත්වයේ දී නිපදවන බහිස්ස්‍රාවීය ද්‍රව්‍ය වකුගඩු වෙතට පරිවහනය කරයි.
(4) සෛලවල ක්‍රියාකාරිත්වයේ දී නිපදවන ඔක්සිජන් පෙණහලු වෙතට පරිවහනය කරයි.

15. රතු රුධිරාණුවල කෘත්‍යය වනුයේ,
(1) ඔක්සිජන් පරිවහනය කිරීම යි.
(2) දේහගත වූ බැක්ටීරියා වැනි විෂ බීජ විනාශ කිරීම යි.
(3) රුධිරය කැටි ගැසීමට දායක වීම යි.
(4) ශරීර උෂ්ණත්වය නිසි ලෙස පවත්වා ගැනීම යි.

16. හෘදය සම්බන්ධයෙන් වන පහත ප්‍රකාශවලින් **වැරදි** ප්‍රකාශය කුමක් ද?
(1) රුධිරය ශරීරය පුරා ගමන් කරවීමට අවශ්‍ය බලය යොදනුයේ හෘදය මගිනි.
(2) හෘදය ශක්තිමත් බවින් අඩු වූ සැහැල්ලු හෘත් පේශිවලින් සෑදී ඇත.
(3) හෘදය උරස් කුහරය තුළ පෙණහලු දෙකට මැදිව වම් පසට බරව පිහිටා ඇත.
(4) හෘදය තම අත මිට මොළවා ගත් විට එම ප්‍රමාණයට විශාලත්වයෙන් සමාන යැයි සැළකේ.

17. හෘදයේ සිට ශරීරය පුරා රුධිරය ගෙන යන්නේ,
(1) ධමනි මඟිනි.
(2) ශිරා මඟිනි.
(3) අනුශිරා මඟිනි.
(4) කේශනාලිකා මඟිනි.

18. **අධ්‍යාතතිය** ලෙස හඳුන්වන රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත රෝගය වන්නේ,
(1) හෘදයාබාධය යි.
(2) අංශභාගය යි.
(3) අධි රුධිර පීඩනය යි.
(4) හදවත් සිදුරු රෝගය යි.

19. රතු රුධිර සෛල වල අඩංගු ප්‍රතිදේහජනක කිසිවක් අඩංගු **නොවන** රුධිර ගණය වන්නේ,
(1) A ය.
(2) A ය.
(3) AB ය.
(4) O ය.



www.pirivena.lk

20. ශ්වසනය සඳහා අවශ්‍ය වාතය ශරීරය තුළට ඇතුළු කර ගැනීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,
(1) ප්‍රශ්වාසය යනුවෙනි. (2) ප්‍රතික්‍රියා කිරීම යනුවෙනි.
(3) දහනය යනුවෙනි. (4) ආශ්වාසය යනුවෙනි.

21. වාතයේ ඇති වායුවලින් ශ්වසනයට අවශ්‍ය කරන ඔක්සිජන් සමස්ත වායුගෝලයේ ප්‍රමාණයෙන්,
(1) 1/5 ක් පමණ වේ. (2) 1/3 ක් පමණ වේ.
(3) 1/2 ක් පමණ වේ. (4) 1/4 ක් පමණ වේ.

22. ළමයෙකුගේ ශ්වසන වේගය මිනිත්තුවකට වාර,
(1) 15-20ක් පමණ වේ. (2) 17-23ක් පමණ වේ.
(3) 18-28ක් පමණ වේ. (4) 17-27ක් පමණ වේ.

23. ආහාර මාර්ගයටත් ශ්වසන මාර්ගයටත් පොදු කොටස වන්නේ,
(1) නාස් විවරය යි. (2) නාස් කුහරය යි. (3) ග්‍රසනිකාව යි. (4) ස්වරාලය යි.

24. ආශ්වාසය සිදු කරන අවස්ථාවේ දී ශ්වාසනාලය හැකිලීම වැළැක්වීමට කාටිලේජීය මුදුවලින් වැර ගැන්වී ඇත්තේ,
(1) ග්‍රසනිකාව යි. (2) ස්වරාලය යි. (3) ශ්වාසනාලය යි. (4) ගර්ත යි.

25. වායු හුවමාරුව කාර්යක්ෂම ලෙස සිදුවීම පිණිස ගර්තවල දැකිය හැකි අනුවර්තනයක් **නො වන්නේ,**
(1) ගර්ත විශාල සංඛ්‍යාවක් පිහිටා තිබීම. (2) ගර්ත අඩු සංඛ්‍යාවක් පිහිටා තිබීම.
(3) ගර්ත බිත්ති ඇතුළත තෙත්ව පිහිටීම. (4) ගර්ත බිත්ති වටා රුධිර කේශනාලිකා රාශියක් පිහිටීම.

26. ශ්වසන පද්ධය ආශ්‍රිත රෝගයක් නො වන්නේ,
(1) සරම්ප ය. (2) ස්වරාල ප්‍රදාහය යි. (3) බ්‍රොන්කයිටීස් ය. (4) නියුමෝනියාව යි.

27. බහිස්‍රාවය ලෙස අර්ථ දක්වන්නේ,
(1) සිරුර තුළ නිපදවෙන අපද්‍රව්‍ය සිරුරෙන් බැහැර කිරීමේ ක්‍රියාවලිය යි.
(2) සංකීර්ණ ආහාර ජීරණය හා අවශෝෂණ ක්‍රියාවලිය යි.
(3) වායු හුවමාරුව හෙවත් ආශ්වාස හා ප්‍රාශ්වාස ක්‍රියාවලිය යි.
(4) සිරුර තුල හෝමෝන නිපදවීමේ ක්‍රියාවලිය යි.

28. බහිස්‍රාවී අවයවයක් **නො වන්නේ,**
(1) පෙනහලු ය. (2) ආමාශය යි. (3) වකුගඩු ය. (4) සම ය.

29. වෘක්කයේ ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය වනුයේ,
(1) වෘක්කාණුව යි. (2) මුත්‍රාශය යි. (3) වෘක්ක යුගලය යි. (4) මුත්‍ර වාහිනිය යි.

30. මුත්‍රවල සංඝටකයක් ලෙස ජලය කොපමණ ප්‍රතිශතයක් අඩංගු වේ ද?
(1) 90% කි. (2) 96% කි. (3) 98% කි. (4) 95% කි.

31. වර්තමානයේ රජරට ප්‍රදේශයේ ජනතාව අතර බහුලව දක්නට ලැබෙන රෝගයකි.
(1) දියවැඩියාව (2) පිළිකා (3) වකුගඩු රෝගය (4) තැලසීමියාව

32. සිරුරෙහි සංවේදන කාර්යය හා බහිස්‍රාවී කාර්යය ඉටු කරන අවයවය වන්නේ,
(1) පිත්තාශය යි. (2) මුත්‍රාශය යි. (3) සම යි. (4) පෙනහළු ය.

33. සමේ ස්වේද ග්‍රන්ථිවලින් නිපදවන දහඩියට රුධිරයෙන් එක් වන අපද්‍රව්‍ය යුගලය වන්නේ,
(1) යූරියා සහ ලවණ යි. (2) යූරියා සහ ඇමෝනියා යි.
(3) යූරියා සහ යූරික් අම්ලය යි. (4) යූරියා සහ ක්‍රියටිනීන් ය.

34. පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයෙකුට සෘජුව ම හෝ වාහකයකු මගින් හෝ බෝවන රෝගයක් **නො වන්නේ,**
(1) සෙම්ප්‍රතිශ්‍යාව යි. (2) කොලරාව යි. (3) තැලසීමියාව යි. (4) ජලභීතිකාව යි.



www.pirivena.lk

35. අපිචර්මය මඟින් සිදු කරන කෘත්‍යයකි.

(1) ශරීරයට විෂබීජ, අපද්‍රව්‍ය ආදිය ඇතුල් වීමට ඉඩ නොදෙන ආරක්ෂක ස්ථරයක් ලෙස ක්‍රියා කිරීම.

(2) දේහ උෂ්ණත්වය යාමනයට උපකාරී වීම.

(3) සම මතුපිට තෙතමනය රැක ගැනීමට උපකාරී වීම.

(4) සීතල අවස්ථාවල රත් වූ වාත ස්ථරයක් සම ආසන්නයේ රඳවා ගෙන දේහ උෂ්ණත්වය රැක ගැනීම.

36. රෝග කාරක ක්ෂුද්‍ර ජීවී කාණ්ඩයක් **නොවන** පිළිතුර කුමක් ද?

(1) දිලීර (2) මැක්කා (3) වෛරස් (4) බැක්ටීරියා

37. බෝ නොවන රෝග අතරින් තීව්‍ර රෝගයක් **නො වන්නේ,**

(1) විෂවීම යි. (2) සර්පයකු දෂ්ට කිරීම යි.

(3) ආඝාතය යි. (4) විදුලිසැර වැදීම යි.

38. බෝ නොවන රෝග සඳහා හේතු වන සාධක අතරින් වෙනස් කළ හැකි සාධකයක් වන්නේ,

(1) ජානමය හේතු ය. (2) මානසික ආතතියයි.

(3) වයස යි. (4) ස්ත්‍රී/පුරුෂ බව යි.

39. නිවැරදි දිවි පෙවෙතකට හුරු වීම සඳහා ඉවහල් **නොවන** කරුණ කුමක් ද ?

(1) දවසේ සුදුසු වේලාවක් නිරන්තරයෙන් භාවනාවේ යෙදීම.

(2) සමබල ආහාර වේලක් ලබා ගැනීමට උනන්දු නොවීම.

(3) නිසි ශරීර ස්කන්ධ දර්ශකය පවත්වා ගැනීම.

(4) මත්ද්‍රව්‍ය, දුම් වැටි සහ බුලත්විට භාවිතයෙන් වැළකීම.

40. රෝගයක් වැලඳුනු පසු සිදු කළ යුතු පිළිවෙත් අතරට අයත් **නොවන කරුණ** වන්නේ,

(1) රෝග සඳහා ප්‍රතිකාර ගැනීමේ දී සුදුසුකම් ලත් වෛද්‍යවරයකු වෙත යොමු වීම.

(2) නියම කරන පරිදි ඖෂධ ලබා ගැනීම.

(3) නියම කළ පැවතුම් වේ නම් ඒවා ඉක්මවා කටයුතු කිරීම.

(4) බෝවන රෝගයක් වැලඳී ඇත්නම් සෙසු අයට පැතිරයාම වළක්වා ගැනීමේ සුදුසු වත් පිළිවෙත් අනුගමනය කිරීම.

* * *



www.pirivena.lk

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[All rights reserved]

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
Ministry of Education Higher Education and Vocational Education - Division of Piriven Education
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

# මධ්‍යවාර පරීක්ෂණය - 2025

## 03 ශ්‍රේණිය

## (09) සෞඛ්‍ය විද්‍යාව - II පත්‍රය

| 09 | S | I, II |
|---|---|---|

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **අටකින්** සමන්විත ය.
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතුය .
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

01. "පෝෂණය හා සෞඛ්‍ය දියුණුව" යන මැයෙන් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහනක් පිරිවෙන් සෞඛ්‍ය දිනය වෙනුවෙන් බලගල්ල සරස්වතී මහ පිරිවෙන් පරිවේනාධිපති හිමියන් ප්‍රමුඛ පරිවේනාචාර්ය මණ්ඩලයේ අනුග්‍රහය ඇති ව ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා හා ගිහි සිසුන්ගේ සහභාගිත්වයෙන් දිවුලපිටිය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීතුමාගේ සම්පත්දායකත්වය මත ගම්පහ දිස්ත්‍රික් විද්‍යා විෂය ගුරු උපදේශකවරයාගේ සංවිධායකත්වයෙන් පසුගිය දා පැවැත්විනි.

එහි ප්‍රධාන දේශනය පැවැත් වූ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීතුමා ආහාරවල අඩංගු පෝෂක පිළිබඳව පැහැදිලි විවරණයක් ඉදිරිපත් කළේ ය. එම පෝෂක ප්‍රධාන කාණ්ඩ දෙකකට බෙදා දක්වමින් ඒ හා සමගාමීව තවදුරටත් කාණ්ඩ පහක් යටතේ කාබෝහයිඩ්‍රේට්, ප්‍රෝටීන් ආදී පෝෂක හඳුන්වා දෙන ලදී.

අනතුරුව සභාව ඇමතූ විද්‍යා විෂය ගුරු උපදේශකතුමන් පෙර දේශනයේ දී විවරණයක යෙදුණු පෝෂක, ශක්ති ජනක පෝෂක, වර්ධක පෝෂක, ආරක්ෂක පෝෂක ලෙස කාණ්ඩවලට බෙදා දක්වමින් සිරුරට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථවල වටිනාකම සහ සමබර ආහාර වේලක වටිනාකම පැහැදිලි කළේ ය. එසේ ම ආහාර පිරමිඩය පිළිබඳව කරුණු රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරමින් ජලයේ ඇති වැදගත්කම, ලාංකීය ජන සමාජයේ පෝෂණ ගැටළු සහ ඒවා වළක්වා ගන්නා අයුරුත් මනාව පැහැදිලි කළේ ය.

**ඉහත සිද්ධිය ඇසුරෙන් පහත i සිට x තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

1.
   i. ආහාරවල අඩංගු පෝෂක බෙදා දක්වන ප්‍රධාන කාණ්ඩ **දෙක** නම් කරන්න.
   ii. කාබෝහයිඩ්‍රේට් හා ප්‍රෝටීන් හැර ආහාර වේලක ඇති පෝෂක වර්ග **දෙකක්** ලියන්න.
   iii. ශක්ති ජනක පෝෂක අඩංගු ආහාර වර්ග **දෙකක්** ලියන්න.
   iv. ආරක්ෂක පෝෂක වර්ග **දෙක** නම් කරන්න.
   v. ඔබ දන්නා විටමින් වර්ග **දෙකක්** නම් කරන්න.
   vi. ඔබ ඉහත (v) සඳහන් කළ විටමින් වර්ග **දෙක** අඩංගු ආහාරයකට නිදසුනක් බැගින් ලියා දක්වන්න.
   vii. ඛනිජ ලවණ වර්ග **දෙකක්** නම් කරන්න.
   viii. ඔබ ඉහත (vii) සඳහන් කළ ඛනිජ ලවණ වර්ග **දෙක** ඉටු කරන **කාර්යයයක්** බැගින් ලියන්න.
   ix. ආහාර පිරමිඩයට අනුව අඩුවෙන් ම ගත යුතු ආහාර වර්ග **දෙකක්** නම් කරන්න.
   x. ආහාර පිරමිඩයට අනුව වැඩියෙන් ම ගත යුතු ආහාර වර්ග **දෙකක්** නම් කරන්න.

(ලකුණු 2x10 =20යි)



www.pirivena.lk

2. i. ලෝක **සෞඛ්‍ය සංවිධානයට අනුව සෞඛ්‍ය** යනු කුමක් දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. කායික යහපැවැත්ම සඳහා ඉවහල් වන යහපුරුදු **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

iii. පුද්ගලයෙකු රෝගී වූ විට අත්විඳීමට සිදු වන ලක්ෂණ **පහක්** නම් කරන්න. (ලකුණු 05)

3. i. ආහාරයකින් ලැබිය යුතු පෝෂක සිරුරට නිසි ලෙස නොලැබීම නිසා ඇති වන **කුපෝෂණ** තත්වයේ අවස්ථා **දෙක** නම් කරන්න. (ලකුණු 02)

ii. ක්ෂුද්‍ර පෝෂක ඌණතා **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

iii. යකඩ ඌණතාව පුද්ගල පැවැත්ම කෙරෙහි ඇති කරන බලපෑම් **පහක්** ලියන්න. (ලකුණු 05)

4. i. රුධිර සංසරණ පද්ධතියේ ප්‍රධාන කොටස් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

ii. රුධිර සංසරණ පද්ධතිය මඟින් ඉටුකරන කාර්යය **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

iii. රුධිර සංසරණ පද්ධතියේ යහපැවැත්ම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **පහක්** නම් කරන්න. (ලකුණු 05)

5. i. **ශ්වසනය** යනු කුමක් දැ යි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

ii. පුද්ගලයෙකුට අයිස්ක්‍රීම්, ජෙලි, සිසිල් බීම වැනි ආහාර පාන නිරතුරුව ගැනීමෙන් ඇති විය හැකි රෝග තත්ත්වයන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

iii. ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝග වළක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග **පහක්** නම් කරන්න. (ලකුණු 05)

6. i. මිනිසාගේ ප්‍රධාන බහිස්‍රාවී ඵලයන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

ii. බහිස්‍රාවී පද්ධතියට අයත් ප්‍රධාන කොටස් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

iii. මුත්‍රවාහිනී පද්ධතියේ යහපැවැත්ම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **පහක්** නම් කරන්න. (ලකුණු 05)

7. i. මිනිස් සමෙහි ප්‍රධාන ස්ථර **දෙක** නම් කරන්න. (ලකුණු 02)

ii. මිනිස් සමෙහි ප්‍රධාන ස්ථර **දෙක** හැර වෙනත් කොටස් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

iii. සමෙහි ස්වස්ථතාව සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **පහක්** නම් කරන්න. (ලකුණු 05)

8. i. **රෝගයක්** යනු කුමක් දැ යි හඳුන්වන්න. (ලකුණු 02)

ii. මිනිසාට රෝග බෝවන විවිධ ආකාර **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

iii. පෞද්ගලික පවිත්‍රතාවය රැක ගැනීමට ඔබ අනුගමනය කළ යුතු ක්‍රියා/පිළිවෙත් **පහක්** ලියන්න. (ලකුණු 05)

***



www.pirivena.lk